සැ. යු. - 2024.01.05 දින පළ කරන ලද අංක 2366 *ගැසට් පත්‍රයේ* III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,367 - 2024 ජනවාරි මස 12 වැනි සිකුරාදා - 2024.01.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | 14 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 15 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 පෙබරවාරි මස 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජනවාරි 19 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

13- B 82532 — 5,403 (2024/01)

# තනතුරු - ඇබෑර්තු

## මහනුවර මහා නගර සභාව

### මහනුවර මහා නගර සභාවේ ශ්‍රම මිල දී ගැනීම් පදනම මත GIS තාක්ෂණ සේවා නිලධාරි සේවය ලබා ගැනීම

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත GIS තාක්ෂණ සේවා සේවය ලබා ගැනීමට නියමිත සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙ හි වම්පස ඉහළ කෙළවරෙ හි සේවාවේ නාමය සඳහන් කර 2024.02.02 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

### GIS තාක්ෂණ නිලධාරි සේවය

1. මිල දී ගැනීමට නියමිත සේවාව : GIS තාක්ෂණ නිලධාරි සේවය (ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත)

2. දෛනික දීමනාව : මසකට රු. 50,000.00 බැගින් (මසකට දින 21 ක් රාජකාරී ඉටු කිරීම සඳහා)

3. කායික සුදුසුකම් : අදාළ සේවය ලබා දීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4. අධ්‍යාපන සුදුසුකම් : විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භූගෝල විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය හා GIS හා Remote Sensing විෂයක් ලෙස හදාරා සමත් වී තිබීම.

5. වෘත්තීය සුදුසුකම් : GIS නිලධාරි වශයෙන් රජයේ ව්‍යාපෘතියක හෝ දෙපාර්තමේන්තුවක GIS දත්ත හැසිරවීම සම්බන්ධයෙන් වසර 10 කට වැඩි පළපුරුද්දක් තිබිය යුතුය.

6. වෙනත් සුදුසුකම් :
   (i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
   (ii) පූර්වාසන්න වසර 03ක කාලය තුළ මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය සහිත විය යුතුය.
   (iii) බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. වයස : සියලුම අයඳුම්කරුවන් වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

8. තෝරා ගැනීමේ ක්‍රමය : සුදුසුකම්ලත් නිලධාරින් පහත කොන්දේසි වලට යටත් ව සේවයට තෝරා ගනු ලැබේ.

   1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවෙන් දළ වශයෙන් දෙගුණයක් පමණ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.
   2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සමත්ව සියලු අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය යුතුය.
   3. ව්‍යුහගත පරීක්ෂණයේ හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සේවා සපයා ගැනීම සඳහා බඳවා ගනු ලැබේ.
   4. මෙම බඳවා ගැනීම හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් වන බැවින් රජයේ කිසිදු තනතුරක් දැරීම සඳහා එය අයිතිවාසිකමක් නොවේ.
   5. සේවය සපයා ගැනීමේ කාලය වසරකි. සේවා අවශ්‍යතාවය මත කාලය දීර්ඝ කිරීම නාගරික කොමසාරිස් විසින් තීරණය කරනු ඇත.

*සටහන* : මෙම සේවා සපයා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

කේ. කේ. ජී. අයි. ඩී. පී. විජේතිලක,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2024 ජනවාරි මස 04 වැනි දින.

01-124

---

# පළාත් පාලන නිවේදන

## ගව ඝාතකාගාරයක් සඳහා බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් විරෝධතා කැඳවීමයි

| | | |
|---|---|---|
| ස්ථානය | - | බෝවැල්ල පාර, ඇලහිල්ලෑවවත්ත, දනාගම, මාවනැල්ල |
| අයදුම්කරුගේ නම | - | එම්. එම්. අල්තාෆ් මයා |
| අයදුම්කරුගේ ලිපිනය | - | බෝවැල්ල පාර, ඇලහිල්ලෑව වත්ත, දනාගම, මාවනැල්ල |

ඉහත නම සඳහන් අයදුම්කරු 2023.09.04 දින මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා වෙත ගව ඝාතකාගාරයක් ආරම්භ කිරීමට අනුමැතිය ඉල්ලා ඇත. 1893 අංක 09 දරන හෝඝාතක ආඥාපනතේ 2(ආ) අනුව ගව ඝාතකාගාරයක් පවත්වාගෙන යාමට බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් මාවනැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් විරෝධතා (නිර්නාමික නොවන) ඉදිරිපත් කළ හැකිය. එකී විරෝධතා ලිඛිතව, පිටපත් දෙකකින් මෙම *ගැසට්* නිවේදනයේ දින සිට දින 21 ක් ඇතුළත මා වෙත යොමු කරන ලෙස දන්වා සිටිමි.

එස්. පී. ආර්. එන්. පියරත්න,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මාවනැල්ල ප්‍රාදේශීය සභාව.

01-91

---

## ඒරාවූර් නගර සභාව

2024 වර්ෂය සඳහා වූ අයවැය සම්බන්ධයෙන් වූ දැන්වීමයි

ඒරාවූර් නගර සභාවේ 2024 වර්ෂය සඳහා වූ අයවැය 1939 අංක 255 දරන නගර සභා පනතේ 178 සහ 179 වගන්තීන් ප්‍රකාරව සකස් කර 2023.12.28 වැනි දින මූල්‍ය කමිටු රැස්වීමේදී ඉදිරිපත් කර තීරණ අංක ECU/FCM/2023/Dec/09 මගින් සම්මත කර විශේෂ කොමසාරිස්ගේ 2023/12/28/01 අංක දරන තීරණය යටතේ අනුමත කරන ලදී.

ඒ අනුව අපගේ සභාවේ අයවැය ලේඛනය කාර්යාල පරිශ්‍රය මහජන පුස්තකාලය, විවේකානන්දා පුස්තකාලය, සභාව සතු සමාජ මාධ්‍ය ජාලාවන් මාර්ගයෙන් 2024.01.01 වැනි දින සිට පරීක්ෂා කල හැකි බවට මෙයින් දැනුම් දෙමි. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් කාර්යාල වේලාවන් තුළදී ඒරාවූර් නගර සභාවට පැමිණ ලබා ගත හැක.

එම්. එච්. එම්. හමීම්,
විශේෂ කොමසාරිස්,
ඒරාවූර් නගර සභාව.

දූ.ක. අංකය - 065 - 2240486

01-86

## හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ගව මස් වෙළඳසැල්/එළු මස් වෙළඳසැල් පවත්වාගෙන යාම වෙනුවෙන් වූ ගෝඝාතක බලපත්‍ර නිකුත් කිරීමට අදාළව ගෝඝාතක ආඥාපනත 7(2) උප වගන්තිය යටතේ කරනු ලබන විරෝධතා කැඳවීමේ නිවේදනය

මෙහි පහත උපලේඛනයෙ හි නම් සඳහන් ඉල්ලුම්කරුවන් විසින් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අනුරූපීව සඳහන් ලිපිනය ඇති ස්ථානයේ එහි විස්තර කර ඇති ස්වභාවයේ ගවමස් වෙළඳසැලක්/එළු මස් වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා ගෝඝාතක බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

මෙම බලපත්‍රය නිකුත් කිරීම පිළිබඳව හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් ඒ කුමක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 (දාහතරක්) ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු ගෝඝාතක ආඥාපනතේ 7(2) උප වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් නිවේදනය කරමි.

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ
ලේකම් හා බලතල කාර්ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී.

2024 ජනවාරි මස 02 වැනි දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේදී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම* | *වෙළඳාම් කරන ස්ථානය* | *වෙළඳාමේ ස්වභාවය* |
|---|---|---|---|
| 01 | එම්.එෆ්.පස්ලියා | අංක 186/1, ඉනිගල පාර, කටුගස්තොට | එළගව මස් වෙළඳසැලක් |
| 02 | අයි.එම්.අසන් | අංක 546, ඉනිගල,කටුගස්තොට | එළගව මස් වෙළඳසැලක් |

01-98

---

## බළන්ගොඩ නගර සභාව

ගෝ ඝාතක ආඥාපනත යටතේ විරෝධතා කැඳවීමයි

මෙහි පහත සඳහන් උපලේඛනයන් හි සවිස්තරාත්මකව දක්වා ඇති ස්ථානයන්හි ගෝඝාතක ව්‍යාපාරයක් සහ මාංශ වෙළඳාම කරගෙන යාම සඳහා 2024 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම සඳහා බළන්ගොඩ නගර සභා සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින දාහතර(14)ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය ඇති බවත්, ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 272 වැනි අධිකාරිය *හෙවත්* ගෝ ඝාතක ආඥාපනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. එච්.ඒ. කරුණාරත්න,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
බලන්ගොඩ නගර සභාව.

2023 දෙසැම්බර් මස 28 වැනි දින,
බලන්ගොඩ නගර සභා කාර්යාලයේදී ය.

**උපලේඛනය 01**

| අනු අංකය | ඉල්ලුම්කරුගේ නම | ගෝඝාතකාගාරය පවත්වාගෙන යනු ලබන ස්ථානය | බලපත්‍රය වලංගු කාල සීමාව |
|---|---|---|---|
| 01 | ෆලීල් මොහොමඩ් රවුෂාන් | බළන්ගොඩ, කහටපිටිය පාර, මිරිස්වත්ත, වරිපනම් අංක 51/3 දරණ ස්ථානය | 2024-01-01 සිට 2024-12-31 දක්වා |

**උපලේඛනය 02**

| අනු අංකය | ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම් කරන ස්ථානය | වෙළඳාමේ ස්වභාවය |
|---|---|---|---|
| 01 | අබ්දුල් මුත්තාලිෆ් මොහොමඩ් රෙමීෂින් අංක 443, දෙහිගස්තලාව, බළන්ගොඩ | පොදු වෙළඳසැල අංක 15 දරන එළුමස් කඩ කාමරය | එළු මස් අලෙවිය |
| 02 | අබ්දුල් රෂීඩ් මොහොමඩ් මිර්ෂාද් අංක 260, කල්තොට පාර මිරිස්වත්ත, බළන්ගොඩ | පොදු වෙළඳසැල අංක 16 දරන ගවමස් කඩ කාමරය | ගව මස් අලෙවිය |

01-119

---

**මුලටියන ප්‍රාදේශීය සභාව**

**දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව මුලටියන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වැනි දින පවත්වන ලද මාසික සභා රැසවීමේදී තීරණ අංක ඉ (18) යටතේ සභාව සම්මත කරන ලද පහත සඳහන් යෝජනාවට එකී පනතේ ඉහත උප වගන්තියෙන් මාතර දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් ලෙස කටයුතු කරන චන්දන කේ. සෙනෙවිරත්න වන මා විසින් අනුමැතිය දෙනු ලැබූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

චන්දන කේ. සෙනෙවිරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
මාතර දිස්ත්‍රික්කය.

2023 නොවැම්බර් මස 20 වැනි දින,
මාතර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ පහත උපලේනය සහ සිතියම් මගින් විස්තර කෙරෙන සීමාවන් ඇතුළත පිහිටියා වූ ප්‍රදේශ සඳහා උපරිම මට්ටමින් සේවාව ව්‍යාප්ත කිරීමට මුලටියන ප්‍රාදේශීය සභාව කටයුතු කර ඇති හෙයින් දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් පිළිගත යුතු බවත්, එම පිළිගැනීමේ යෝජනා සම්මුතියට මාතර දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට ක්‍රියාකළ යුතු බවටත් මුලටියන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ (මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය) පිහිටියා වූ අංක 275 දෙයියන්දර ග්‍රාම නිලධාරි කොට්ඨාසය ද, අංක 272A නෙරලම්පිටිය, අංක 275 C ගල් ඇටුඹ, අංක 275D මඩුවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයන්හි කොටස්වලින් සැදුම්ලත්

උතුරට : ඔව්ලාන ඇළෙහි මධ්‍ය රේඛාව හා හරත කුඹුර ඇලේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂයෙන් (අළු කැටිය ලැලි කඩේ අසලින්) ආරම්භ වී හරත කුඹුර ඇළෙහි මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර සහ උතුරු දිශානුගතව ඇදි රේඛාව කළුගලදෙනිය පොකුණේ නැගෙනහිර මායිමෙන් ගලන කළුගලදෙනිය ඇළෙහි මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට නැගෙනහිර දෙසට ලම්භකව අඳින ලද සෘජු රේඛාවක් ඔස්සේ එම ඇළෙහි වම් ඉවුර දක්වා ද, එතැන් සිට එම වම් ඉවුර ඔස්සේ උතුරු දෙසට ඇඳි රේඛාව කොහිල ගහ දෙනිය ඉඩමේ දකුණු මායිම දක්වා ද, එතැන් සිට එම ඉඩමේ දකුණු මායිම ඔස්සේ නැගෙනහිර දෙසට ඇදී රේඛාව දෙයියන්දර - හඳුගල මාර්ග යේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුර සහ ඊශාන දෙසට ඇඳි රේඛාව 3/2 දරන පිට ඇල බෝක්කුවෙහි මධ්‍ය ලක්ෂය දක්වා ද, එතැන් සිට එම ඇලෙහි මධ්‍ය රේඛාව ඔස්සේ ගිණිකොණ දිශානුගතව කිරම ආරේ මධ්‍ය රේඛාව හමුවන තෙක්ද,

නැගෙනහිරට : අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට කිරම ආරේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිනිකොණ දකුණු දිශානුගතව ඇඳි රේඛාව පණ්ඩිත පෝරුව පාලමේ (මහඕකන්ද පාලම) මධ්‍ය ලක්ෂය දක්වා ද, එතැන් සිට පණ්ඩිත පෝරුව මාර්ගයේ (දංහේන කිරිවැල්දෙනිය පාර) මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශානුගතව ඇඳි රේඛාව දෙයියන්දර කිරම මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, (ගොන්නගාව) එතැන් සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත, දකුණු දිශානුගතව ඇඳි රේඛාව කි.මී. 1.9 ක් දුරින් පිහිටි ලක්ෂයක් දක්වා ද,

දකුණට : අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට නිරිත දිශානුගත ව ඇඳි රේඛාව දෙනගම, මුලටියන මාර්ගයේ මධ්‍ය රේඛාව දක්වා ද එතැන් සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දෙසට ඇඳි රේඛාව 1/9 බෝක්කුවෙහි (කෝපිවත්ත බෝක්කුවෙහි) මධ්‍ය ලක්ෂය දක්වා ද, එතැන් සිට කෝපිවත්ත ඇළෙහි මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත දෙසට ඇඳි රේඛාව වැවල පියද්දේ සිට ගලන අතු ගංගාවේ මධ්‍ය රේඛාව දක්වාද, එතැන් සිට එම අතු ගංගාවේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දෙසට ඇඳි රේඛාව කිරම ආරෙහි මධ්‍ය රේඛාව දක්වාද, එතැන් සිට කිරම ආරෙහි මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ, බස්නාහිර නිරිත, උතුර සහ බස්නාහිර දිශානුගතව ඇඳි රේඛාව සීනිපැල්ල පාලමේ මධ්‍ය ලක්ෂය දක්වා ද,

බටහිරට : අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට කිරම ආරේ මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ දිශානුගතව ඇඳි රේඛාව ඔව්ලාන ඇළෙහි මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට එම ඇළෙහි මධ්‍ය රේඛාව ඔස්සේ උතුර, ඊසාන හා වයඹ දිශානුගතව ඇඳි රේඛාව ආරම්භක ලක්ෂය හමුවන තෙක් ද වන මායිම් වලින් වට වූ සීමාව ඇතුළත පිහිටි වර්ග කිලෝමීටර 2.35 ක වර්ගඵලය සීමාව වේ.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(1) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 සැප්තැම්බර් මස 22 දින මහ සභාවේ ඉ(18) සභා සම්මුතිය අනුව, ඉහත දක්වා ඇති බල ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා මෙයින් අනුමැතිය ලබා දෙමි.

# දෙයියන්දර නගරය ආශ්‍රිත දියුණු ගම් බල ප්‍රදේශය




වර්ගඵලය - ව.කි 2.35

## ගම්පහ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ''අ''වගන්තිය අනුව කටයුතු කරමින් 24(1) ''ආ'' වගන්තිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ සඳහන් මාර්ග ගම්පහ ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සලකුණු කර ඇත්තේ යම් ඉඩමක් හරහා ද, එම ඉඩමේ අයිතිකරු ලෙස ඉඩමට හිමිකම්පාන යම් පාර්ශවයක් වේ නම් එම පාර්ශවය මෙම දැන්වීම පළ කළ දින සිට මාස 01 ක් ඇතුළත එම ඉඩමට තමන්ගේ ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළ යුතු බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ. එම ලබා දුන් කාලය තුළ විරෝධතා ඉදිරිපත් නොවූ බැවින් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඇතිව එම මාර්ග ප්‍රාදේශීය සභා මාර්ග ලෙස පිළිගෙන පාලනය කරන බව වැඩිදුරටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. ඒ. එන්. පී. සුරවීර,<br>
ප්‍රාදේශීය සභාවේ ලේකම් හා<br>
ගම්පහ ප්‍රාදේශීය සභාවේ<br>
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,<br>
ගම්පහ ප්‍රාදේශීය සභාව.

2023 ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින.

### උපලේඛනය

| අනු අංකය | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | මාර්ගයේ නම | මාර්ගයේ | | මාර්ගයේ | | මිනින්දෝරුවරයාගේ නම | පිඹුරුපත් අංකය හා දිනය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ආරම්භය | අවසානය | දිග(මී) | පළල (මී) | | |
| 1 | 218/ඒ මාකෙවිට උතුර | මාකෙවිට ජුබිලි මාවත | 201 ගම්පහ ජා-ඇල ප්‍රධාන මාර්ගය | ඇනිකට් එක අසලින් | 0.740 | 2.88 | වී. ශම්මුගනාදන්, කලම්බු ඉන්ස්ටිටියුට් ෆෝ ඉංජිනියරින් සර්වේ | GPS-024 2023/02/06 |
| 2 | 216/බී තිබ්බටුගොඩ | තිබ්බටුගොඩ ගැමුණු මාවත | 278 ජා-ඇල ගණේමුල්ල ප්‍රධාන මාර්ගය | ඌරුවල් ඔය ඇනිකට් එක අසලින් | 0.629 | 2.71 | වී. ශම්මුගනාදන්, කලම්බු ඉන්ස්ටිටියුට් ෆෝ ඉංජිනියරින් සර්වේ | GPS-025 2023/02/06 |
| 3 | 242/සී ඇඹරළුව දකුණ | ඇඹරළුව සිංහ මාවත | ඇඹරළුව ප්‍රජා ශාලාව අසලින් | ඉත්තෑගල පාර | 1,209 | 3.73 | වී. ශම්මුගනාදන්, කලම්බු ඉන්ස්ටිටියුට් ෆෝ ඉංජිනියරින් සර්වේ | GPS-026 2023/02/06 |
| 4 | 236/බී ගණේමුල්ල දකුණ | ගණේමුල්ල තුත්තිරිහේන ගොවිපල පාර | සුමේධ මාවත | සීලානන්ද කණිෂ්ඨ විදුහල | 0.691 | 3.53 | වී. ශම්මුගනාදන්, කලම්බු ඉන්ස්ටිටියුට් ෆෝ ඉංජිනියරින් සර්වේ | GPS-027 2023/02/06 |
| 5 | 236 මාහේන 236 අමුණුගොඩ උතුර | අමුණුගොඩ පැරකුම් මාවත | අමුණුගොඩ රාජ මහා විහාරය අසලින් | පහළ යාගොඩ පාර (ට්‍රැක්මෝ පාර) | 1,153 | 3.31 | වී. ශම්මුගනාදන්, කලම්බු ඉන්ස්ටිටියුට් ෆෝ ඉංජිනියරින් සර්වේ | GPS-028 2023/02/06 |

| අනු අංකය | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | මාර්ගයේ නම | මාර්ගයේ | | මාර්ගයේ | | මිනින්දෝරුවරයාගේ නම | පිඹුරුපත් අංකය හා දිනය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ආරම්භය | අවසානය | දිග(මී) | පළල (මී) | | |
| 6 | 243 පහළ ඉඹුල්ගොඩ නැගෙනහිර | ඉඹුල්ගොඩ එම්.එන්.එස්.එස්. පෙරේරා මාවත | ඇඹරළුව පාර (514 මාර්ගය) | රණවිරු ජගත් වසන්ත මාවත | 0.978 | 2.71 | වී. ශම්මුගනාදන්, කලම්බු ඉන්ස්ටිටියුට් ෆෝ ඉංජිනියරින් සර්වේ | GPS-029 2023/02/06 |
| 7 | 239 බැළුම්මහර 235/සී ඉහළ යාගොඩ දකුණ | බැළුම්මහර කොස්වත්ත පාර | සේරුවිල පාර බැංකුව අසල | ඉහළ යාගොඩ පාර බේකරි කඩය දක්වා | 0.884 | 2.70 | වී. ශම්මුගනාදන්, කලම්බු ඉන්ස්ටිටියුට් ෆෝ ඉංජිනියරින් සර්වේ | GPS-0230 2023/02/06 |
| 8 | 237/බී බටහිර කොස්සින්න I 237/බී බටහිර කොස්සින්න II 244/සී කොස්සින්න නැගෙනහිර I 237/ඩී කටුවාලමුල්ල දකුණ | කටුවාලමුල්ල පාර | කොස්සින්න රාජ මහා විහාරය අසලින් | හෙට්ටිකන්ද පාර කෙළවර | 1,550 | 4.26 | වී. ශම්මුගනාදන්, කලම්බු ඉන්ස්ටිටියුට් ෆෝ ඉංජිනියරින් සර්වේ | GPS-033 2023/02/06 |
| 9 | 235 ඔරුතොට උතුර | කෝට්ටෙගොඩ පාර | යාගොඩ අලුත් පාර | යාගොඩ දුම්රියපොල අසලින් | 1,228 | 3.34 | වී. ශම්මුගනාදන්, කලම්බු ඉන්ස්ටිටියුට් ෆෝ ඉංජිනියරින් සර්වේ | GPS-032 2023/02/06 |
| 10 | 237 කොස්සින්න නැගෙනහිර | පෙරහැර මාවත | 214 බස් මාර්ගය (කළුවල පාර) | සූර්ය මාවත | 0.790 | 3.43 | වී. ශම්මුගනාදන්, කලම්බු ඉන්ස්ටිටියුට් ෆෝ ඉංජිනියරින් සර්වේ | GPS-033 2023/02/06 |

01-120

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.